No 01

ශ්‍රේණිය
06

අවසාන වාර පරීක්ෂණය
සිංහල භාෂාව හා සාහිත්‍යය - I,II

පාසලේ නම : .....

ඇතුළත්වීමේ අංකය : ..... කාලය : පැය 02 යි.

I කොටස

- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**
- **අංක 1 සිට 20 තෙක් ප්‍රශ්නවල නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. නූතන සිංහල අක්ෂර මාලාවේ ව්‍යංජන අක්ෂර ගණන වන්නේ,

1. 60 කි 2. 18 කි 3. 42 කි 4. 40 කි

02. "කැලය" යන වචනයෙහි ඇතුළත් පිල්ලම වන්නේ ,

1. ඇලපිල්ල 2. කෙටි ඇදපිල්ල 3. දිගු ඇදපිල්ල 4. ඉස්පිල්ල

03. සඤ්ඤක අක්ෂරයක් සහිත වචනය තෝරන්න.

1. කඹය 2. කඩය 3. කළය 4. කණුව

04. "හති ලන කලැ මුඳුනින් මහ කළු වලාකුළු නික්මෙයි."
ඉහත සඳහන් වාක්‍යයේ නාම විශේෂණ පදය වන්නේ ,

1. නික්මෙයි 2. මුදුනින් 3. වලාකුළු 4. මහ කළු

05. පොලිස් නිලධාරීහු අනතුර සිදු වූ ස්ථානයට වේගයෙන් දිවුවෝ ය.
ඉහත වාක්‍යයේ ක්‍රියා විශේෂණ පදය වන්නේ ,

1. නිලධාරීහූ 2. වේගයෙන් 3. ස්ථානයට 4. දිවුවෝ ය

06. " දිනිඳු" යන පදයට සමාන පදය වන්නේ ,

1. සූර්යයා 2. දුප්පත් 3. චන්ද්‍රයා 4. පහසු

07. "ආගන්තුක" යන පදයට විරුද්ධ පදය වන්නේ,

1. විශේෂ 2. අමුත්තා 3. නේවාසික 4. මගියා

08. පහත සඳහන් වචන අතරින් බහුවචන පදය තෝරන්න.

1. වෘක්ෂය 2. පුෂ්පය 3. නීතිඥයා 4. කම්කරුවෝ

09. පහත සඳහන් වචන අතරින් ස්ත්‍රී ලිංග නාම පදය වන්නේ ,

1. යහළුවා 2. මහිලාව 3. නිවස 4. ගිරවා

- **10 සහ 11 ප්‍රශ්නවල හිස්තැනට ගැළපෙන පදය තෝරන්න.**

10. ..... රෝගීන් රුක බලා ගනිති.

1. හෙදිය 2. හෙදියෝ 3. හෙදියන් 4. හෙදියක

11. මව ..... රකින්නී ය.

1. දරුවන් 2. දරුවෝ 3. දරුවෙක් 4. දැරියක්

- **12 සහ 13 ප්‍රශ්නවල හිස්තැනට ගැළපෙන ක්‍රියා පදය තෝරන්න.**

12. තොපි නැටුම් බලන්නට _____

1. ගියා ය.
2. ගියෝ ය.
3. ගියෙහු
4. ගියේ ය

13. කුරුල්ලෝ කැඳලි කරා _____

1. පියාඹයි.
2. පියාඹන්නේ ය.
3. පියාඹන්නීය.
4. පියාඹන්නෝ ය.

- **පහත සඳහන් වාක්‍යවල යෙදී ඇති විරාම ලක්ෂණ තෝරන්න.**

14. උපාලි මහත්තයා , අර බලන්න.

1. ප්‍රශ්නාර්ථ ලකුණ හා තිත
2. විස්මයාදි ලකුණ හා තිත
3. කොමාව හා තිත
4. පෙරළි කොමා හා තිත

15. මෙතනින් පාර මාරු වෙනු !

1. කොමාව
2. විස්මයාදි ලකුණ
3. ප්‍රශ්නාර්ථ ලකුණ
4. පෙරළි කොමා

16. "මග දිගට ජන කතා" කෘතියේ කතුවරයා වන්නේ ,

1. ඩී.ජී. වික්‍රමසිංහ මහතා
2. ඩබ්.ඒ. අබේසිංහ මහතා
3. කුමාරතුංග මුනිදාස මහතා
4. මාර්ටින් වික්‍රමසිංහ මහතා

17. " පුංචි පැළේ ගස වෙනා " යන ස්වයංචරිතාපදාන කෘතියෙහි රචකයා කවු ද?

1. මහගමසේකර මහතා
2. ඇස්. මහින්ද හිමි
3. කේ. ජයතිලක මහතා
4. ඩේවිඩ් කරුණාරත්න මහතා

- **18 හා 19 ප්‍රශ්නවල ඉරි ඇඳි පදයේ අර්ථය දැක්වෙන නිවැරදි පිළිතුර තෝරන්න.**

18. "මේ වනයෙහි විෂ වෘක්ෂයෝත් අමනුෂ්‍යාධිගෘහිත වූ <u>පුෂ්කරණීහුත්</u> වෙති"

1. පිරිස
2. කැලෑව
3. අරක්ගත්
4. පොකුණු

19. " හිස අවුල් කරගෙන
කිළුටු <u>වැරහැලි</u> ඇඳගෙන

1. ලස්සන ඇඳුම්
2. ඉරීගිය ඇඳුම්
3. අලුත් ඇඳුම්
4. සුදු ඇඳුම්

20. පහත සඳහන් ප්‍රස්තාව පිරුළ සම්පූර්ණ කරන්න.

" ඇටි කෙහෙල් කාපු ....."

1. උගුඩුවා වාගේ
2. රිලවා වගේ
3. වඳුරා වාගේ
4. උරුලෑවා වාගේ

(ලකුණු 2 x 2 = 40)

II කොටස

- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**

01. පහත සඳහන් මාතෘකා අතරින් එකක් තෝරාගෙන වචන 100කට නොඅඩු වන සේ රචනාවක් ලියන්න.

i. ජල සම්පත සුරකිමු
ii. මගේ මව්බිම
iii. අපේ ජාතික වීරයෝ
iv. කියවීමේ අගය

(ලකුණු 20)

02. පෙළ පොතෙහි පාඩම් ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. "දැන් උල්පතේ හැටි කොහොමද කියා බලමු"
අ) මෙසේ පවසන්නේ කවුරුන් ද ?
ආ) මෙම ප්‍රකාශය අසා සිටියේ කවුද ?
ඇ) මෙම ප්‍රකාශය ඇතුළත් පාඩම කුමක් ද?

ii. " ඔබ වහන්සේ හට මම දාමරික නොවෙමි "
අ) ඉහත ප්‍රකාශය කළේ කවුරුන්ද ?
ආ) මෙම ප්‍රකාශය ඇතුළත් පාඩමේ නම කුමක් ද?
ඇ) එම පාඩමේ එන රජුගේ නම කුමක් ද?

iii. "කඳ කුමරිඳු ලෙසින
.....
නො මඳ සව් ඉසුරෙන
වැඩිණි නව සඳ මෙන් දිනෙන් දින"
අ) ඉහත කවියේ දෙවන පද පේළිය සම්පූර්ණ කරන්න.
ආ) "කඳ කුමරිඳු" යනුවෙන් හඳුන්වන්නේ කවුද ?
ඇ) ඉහත කවිය උපුටා ගත් පද්‍ය කෘතියේ නම ලියන්න.

iv. "බලං අපි උන්නේ
එහෙං එනකන්නේ
මෙහෙං ඉඳගන්න
මෙහෙං ඉඳගන්න"
අ) මෙසේ ප්‍රකාශ කරන්නේ කවුද ?
ආ) එහෙං පැමිණියේ කවුද ?
ඇ) ඉහත ප්‍රකාශය ඇතුළත් නාට්‍යයේ නම කුමක් ද?

v. "හොඳයි එහෙනම් , මට කල්පනා වෙනවා එක උපායක් "
අ) මෙම ප්‍රකාශය කළේ කවුද ?
ආ) මෙම ප්‍රකාශය කළේ කාට ද ?
ඇ) මෙම ප්‍රකාශය අයත් පාඩම උපුටා ගත් කෘතිය නම් කරන්න.

(ලකුණු 3 × 5 = 15)

03. පහත සඳහන් පද්‍ය කියවා, අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

පෙර දිග ලෝකයේ බබළන මුතු ඇටය
පණ ඇති මහා සමුදුර පවුරෙන් වටය
හෙළ දිවයින මගෙයි මා ඉපදුණු රටය
ලොව අන් සියලු දිවයින් මේකට යටය

තෝපා තඹලගම මිණිපේ මින්නේරි
මහ වැව්වලින් දියවැල් ඇදෙමින් බේරී
සරු කරවයි කුඹුරු නිල් පැහැයෙන් මේරි
මගේ ලක් මෑණියන් දෑ හරි පින් කාරී

i. "පෙරදිග ලෝකයේ බබළන මුතු ඇටය" යනුවෙන් හඳුන්වන්නේ කුමක් ද?
ii. මගේ රටට අන් රටවල් යටත් බව කියවෙන පද පේළිය උපුටා දක්වන්න.
iii. නිල් පැහැයෙන් සරු කරවන්නේ කුමක් ද?
iv. කවියේ සඳහන් මහ වැව් දෙකක් නම් කරන්න.
v. පහත සඳහන් පදවලට සමානාර්ථ පද කවියෙන් උපුටා ලියන්න.

(ඇ) දූපත
(ආ) මුහුදු

(ලකුණු 2 × 5 = 10)

04. ඔබ ගිය විනෝද චාරිකාවක් පිළිබඳ විස්තර සඳහන් කරමින් ඔබගේ හොඳ ම යහළුවාට හෝ යෙහෙළියට යවන ලිපිය ලියන්න.

නැතහොත්

ලෝක ගුරු දිනය වෙනුවෙන් ඔබගේ පන්තිභාර ගුරුතුමියට හෝ ගුරුතුමාට ලබා දීමට සුදුසු සුබ පැතුම් පතක් සකස් කරන්න.

(ලකුණු 15)